# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

එච්. සුරේන් ඩී. ඒ. පෙරේරා,
අංක ¾ A,
දිගන පාර,
නත්තරම්පොත,
මහනුවර

**<u>අභියාචක</u>**

**අභියාචනා අංකය : 461/2021**

**එදිරිව**

1. තැපැල් මූලස්ථානය,
   කොළඹ

2. නියෝජ්‍ය තැපැල්පති කායර්ාලය
   මහනුවර

**<u>පොදු අධිකාරිය</u>**

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවධර්න - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක සිටී.
පොදු අධිකාරිය නැත.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - 2022.04.26
පොදු අධිකාරිය - 2022.04.25

**විභාග කළ දිනය** : 2022.05.05

**තීරණය කළ දිනය** : 2022.05.05

**<u>කොමිෂන් සභාවේ තීරණය:</u>**

**අභියාචනයට පසුබිම්වූ කරුණු**

අභියාචක විසින් 2020.09.10 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

> *"වලපනේ තැපැල් කායර්ාලයේ පවත්වාගෙන යන තැපැල්කරුවන්ගේ රෙජිස්තරයේ සහ ලියුම් භාරදීමේ රෙජිස්තරයේ 2018.08.13 වන දින සිට 2018.09.01 වන දින දක්වා ඒ ඒ දිනයන්වලට අදාල සටහන්වල සහතික පිටපතක්"*

තොරතුරු නිලධාරි 2020.10.13 දිනැතිව පිළිතුරු සපයමින් ප්‍රකාශ කර සිටින්නේ,

*"තොරතුරු ඉල්ලීම පනතේ 5 වන උපවගන්තියේ විධිවිධාන අනුව පහත සඳහන් කර ඇති හේතු මත ප්‍රතික්ෂේප කරන ලද බව දන්වමි.*

*2018.08.13 - 2018.09.01 අදාල කල සීමාව තුල වලපනේ තැපැල් කායර්ාලයේ සිදු වූ අක්‍රමිකතාවක් සම්බන්ධයෙන් තැපැල් දෙපාතර්මේන්තුව මගින් මූලික විමෂර්ණයක් සිදු කරන බැවින් හා එම සිදුවීම සම්බන්ධයෙන්ම වලපනේ ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බැවින් ඔබ විසින් ඉල්ලීම් කරන ලද තොරතුරු මෙම අවස්ථාවේ දී ලබා දීමේ හැකියාවක් නොපවතින බව සඳහන් කරන අතරම දෙපාතර්මේන්තු විමෂර්ණ කටයුතු හා අධිකරණ ක්‍රියාමාගර් නිම වීමෙන් පසු ඔබගේ ඉල්ලීම සපුරාලිය හැකි බව ද දන්වමි."* යනුවෙනි.

මෙයින් අතෘප්තියට පත් අභියාචක විසින් 2020.10.21 දිනැතිව නම්කළ නිලධාරි වෙත අභියාචනයක් යොමු කර ඇත.

නම්කළ නිලධාරි 2021.02.10 දිනැතිව පිළිතුරු සපයමින්,

> *" 02.අදාල තොරතුරු ලබා දීම සම්බන්ධයෙන් මෙම පොදු අධිකාරිය සතුව විශේෂ ක්‍රමවේදයක් පවතී. මෙම කරුණට අදාලව දෙපාතර්මේන්තු විමෂර්ණයක් හා අධිකරණ ක්‍රියාමාගර්යක් පවතින බැවින් ඒ සම්බන්ධව මා වෙත අධිකරණය මගින් නියෝගයක් ලබාදුන් අවස්ථාවකදී මා හෝ මාගේ නියෝජිතයෙකු අධිකරණය වෙත අදාල තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ."* දන්වා ඇත.

මෙයින් අතෘප්තියට පත් අභියාචක විසින් 2021.03.03 කොමිෂන් සභාව වෙත ඉහත අංක දරණ අභියාචනය යොමු කර ඇත.

පොදු අධිකාරිය විසින් 2022.04.25 දිනැතිව, කොමිෂන් සභාව වෙත ලිඛිත කරුණු දැක්වීමක් සිදු කරමින් පහත පරිදි කරුණු දක්වා ඇත.

> *"2018.08.03 – 2018.09.01 අදාල කාල සීමාව තුළ වලපනේ තැපැල් කායර්ාලයේ සිදුව ඇති අක්‍රමිකතා සම්බන්ධයෙන් 1 වන උප ලේඛනය යටතේ චෝදනා පත්‍ර නිකුත් කොට (අංක 10/96/ඒපු/46/2018- නි/ම/05/4003/2018) විධිමත් විනය පරීක්ෂණය මේ වන විට පැවැත්වෙන බැවින් එය අවසන් වනතුරු අදාළ තොරතුරු ලබා දීමට නොහැකි බව කාරුණිකව දන්වා සිටිමි."*

අභියාචක විසින් 2022.04.26 දිනැතිව ලිඛිත කරුණු දැක්වීමක් සිදු කරමින් පවසා ඇත්තේ,

> *" .......මාගේ සේවාදායක වන සවරිමුත්තු ඇන්ඩෘ යන අය වලපනේ දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ B591/18 දරණ නඩුවේ දෙවන විත්තිකරු වශයෙන් නම්කර නඩුකරයක් 2018.09.12 දින සිට පවරා පවත්වාගෙන යමින් පවතී.....*
>
> *එකී නඩුකරය සඳහා පදනම් වූ හේතුව වශයෙන් දක්වා ඇත්තේ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අවශ්‍ය ලිපියක් කැළණිය විශ්ව විද්‍යාලයට තේරී පත් වූ දරුවකුට නියමිත දිනට පෙර ලබා දීමට අපොහොසත් වීමකි......*
>
> *නමුත් එම තොරතුර අධිකරණ කටයුත්තකට සම්බන්ධය යන හේතුව නිසා පමණක්ම ලබා දීම ප්‍රතික්ෂේප කළ නොහැකි අතර එය පුරවැසියා සතු පූලුල් අයිතිවාසිකමක් යටපත් කිරීමට සාධාරණ හෝ යෝග්‍ය හේතුවක් නොවන බව අපගේ විශ්වාසයයි.*

*තැපැල්කරුවන්ගේ රෙජිස්ටරය සහ ලියුම් භාරදීමේ රෙජිස්ටරය යනු පොදු ලේඛන වන බැවින් එවැනි ලේඛනයක් වෙත ප්‍රවේශවීමට ඇති අයිතිය අහිමිකිරීම පුරවැසි අයිතිවාසිකම් වලට බරපතල අගතියකි..........*

*යම් අවස්ථාවක ඉල්ලා සිටින සියලු තොරතුරු අධිකරණයේ විභාග වන නඩු කටයුතු වලට සම්බන්ධ විය හැකි අතර බොහෝ අවස්ථාවල තැපැල් භාණ්ඩ කුවිතාන්සි අධිකරණ කටයුතු වලට ඉදිරිපත් වේ. එවැනි අවස්ථාවක සාමාන්‍ය ජනතාවට එම කුවිතාන්සි සම්බන්ධයෙන් තැපැල් කාර්යාලවලින් විමසීම් සිදු කළ හැකිය මක්නිසාදයත් එම ලිපි යොමු කර එම කුවිතාන්සි ආදිය ලබා ගන්නේ ලිපි තැපැල් කරන්නා වීම හෙයිනි........*

*එසේම එම තොරතුර හෙළිදරව් කිරීමෙන් අධිකරණයේ විභාග වන නඩුවට අගතියක් ඇති වන්නේ හෝ දෙපාතර්මේන්තු පරීක්ෂණයට අගතියක් ඇති වන්නේ කෙසේදැයි පැහැදිලි කිරීමකින් තොරව හුදු අධිකරණ කටයුත්තක් සිදුවීම යන කාරණය පමණක් හුවා දැක්වීමෙන් අදාළ තොරතුරු නිළධාරීන් තොරතුරු ඉල්ලන පුරවැසියන්ට ඉටුකළ යුතු වගකීම පැහැර හැර ඇති අතර හුදු පිළිතුරක් ලබා දී එකී අයිතිවාසිකම් අධෛර්යයට පත් කිරීමෙන් පනතේ මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකමේ අභිප්‍රාය දුවර්ල කර ඇති බව පැහැදිලිය.......*

*එමනිසා උක්ත තොරතුරු ඉල්ලීම තුළ සිදුවන හානියක් පිළිබඳ නිශ්චිතව දක්වා නොමැති බැවින් එලෙස හානියක් නොවන නිසාත් එම තොරතුරු පුරවැසියන් ලෙස දැනගැනීමට මූලික අයිතිවාසිකමක් උපචය වන නිසාත් හෙළිදරව් කිරීමේ හැකියාවක් අදාළ අධිකාරිය සතු බව නිගමනය කළ හැකිය...*" යනුවෙනි.

**සළකා බැලීම**

මෙම තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් නම් කළ නිලධාරි වෙත සිදු කළ අභියාචනය විමසීමෙන් පසුව නම් කළ නිලධාරි විසින් 2021.02.10 දිනැතිව පහත සඳහන් අයුරින් තීරණයකට එළඹ ඇත.

*"අදාල තොරතුරු ලබා දීම සම්බන්ධයෙන් මෙම පොදු අධිකාරිය සතුව විශේෂ ක්‍රමවේදයක් පවතී. මෙම කරුණට අදාලව දෙපාතර්මේන්තු විමෂර්ණයක් හා අධිකරණ ක්‍රියාමාගර්යක් පවතින බැවින් ඒ සම්බන්ධව මා වෙත අධිකරණය මගින් නියෝගයක් ලබාදුන් අවස්ථාවකදී මා හෝ මාගේ නියෝජිතයෙකු අධිකරණය වෙත අදාල තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ."*

මේ අනුව නම් කළ නිලධාරිගේ තීරණයට මැදිහත් වීමට තරම් කරුණු කිසිවක් ඉදිරිපත්ව නොමැති බැවින් මෙම අභියාචනය ප්‍රතික්ෂේප කරමු.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය වෙත, තොරතුරු නිලධාරි වෙත සහ අභියාචක වෙත දන්වා යැවීමට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය ප්‍රතික්ෂේප කරන ලදී.